# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1918/18 - 2015 ජුනි මස 11 වැනි බ්‍රහස්පතින්දා - 2015.06.11

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

විධාන අංක. 57.

**2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනත**

12(2) වැනි වගන්තිය යටතේ විධානය

2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනතේ 12(2) වගන්තිය යටතේ බලතල ප්‍රකාරව ක්‍රියා කරමින්, සියළු ඇසුරුම් කල පානීය ජල බෝතල් නිෂ්පාදකයින්, බෙදා හරින්නන් හා වෙළෙඳුන් විසින්, අදාළ පොලිමර් ද්‍රව්‍යයන්ගෙන් සාදන ලද ජල බඳුන් / බෝතල්, පහත සඳහන් ශ්‍රී ලංකා ප්‍රමිතිය පදනම් කරගෙන නිකුත් කරන ලද SLS භාණ්ඩ සහතික ලාංඡනය දරන්නේ නම් මිස එකී පොලිමර් ද්‍රව්‍යයන්ගෙන් සාදන ලද බඳුන්වල / බෝතල්වල පානීය ජලය ඇසිරීම, බෙදාහැරීම, ප්‍රවාහනය, ගබඩා කිරීම හෝ තොග වශයෙන් හෝ සිල්ලර වශයෙන් විකිණීම, විකිණීම සඳහා ඉදිරිපත් කිරීම, විකිණීම සඳහා ප්‍රදර්ශනය කිරීම නොකළ යුතු බවට මෙයින් විධාන කරනු ලැබේ.

පොලිමර් ද්‍රව්‍යයන්ගෙන් සාදන ලද පානීය ජලය ඇසිරීම සඳහා භාවිතා කරනු ලබන බඳුන් / බෝතල් සඳහා වන ශ්‍රී ලංකා ප්‍රමිති පිරිවිතර : SLS 1336 : 2008

මෙම විධානයේ වර්ෂ 2016 සැප්තැම්බර් මස 01 වන දින සිට බලපැවැත්වෙනු ඇත.

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ අණ පරිදි,

රූමි මර්සූක්,
සභාපති.

2015 ජුනි මස 01 වැනි දින,
කොළඹ දී ය.

06 - 759

1A - PG 2503 — 206 (2015/06) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*